**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 16 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලීරු. 2,018,711 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පොලී ආදායම නිවැරදිව තහවුරු කර ගිණුම්ගත කළ යුතුය. | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මගින් එය නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | අක්කර 7 ක ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙහි තැන්පත් කර තිබූ රු.3,300,000 ක්, ඉඩම අත්පත් කර ගැනීමට පෙර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | අත්පත් කර ගෙන ප්‍රාග්ධනිත කල යුතුය. | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මගින් මෙම කරුණ නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ශේෂය හා ඊට අදාල උපයෝගී ලේඛන අතර රු. 2,904,603 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුය. | සේවක ණය 2020 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බවත් ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් බැංකුව විසින් ආදාළ ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැති බවත් දන්වමි. |
| (ඈ) | වටිනාකම රු. 6,055,573 ක් වූ පුස්තකාල පොත් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය | 2020 අවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී උපලේඛන සමගම ඉදිරිපත් කරනු ලබන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත (86 සහ 87 වගන්ති) | රු. 184,000 ක උපයන විට ගෙවීම් අයකර ප්‍රේෂණය කර නොතිබුණි. | පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිවැරදිතාවය තහවුරු කර ගෙන කටයුතු කරන බව දන්වමි.. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(ඇ) | 2009 වර්ෂයේ සිට පැවති තත්කාර්ය අතුරු අග්‍රිම 04 ක් හා 2017 වර්ෂයේ සිට පැවති අග්‍රිම 01 ක් ලෙස එකතුව රු. 255,161 ක් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 1985 මැයි 21 දිනැති අංක 291 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.2(අ) ජේදය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ දායක වීමට මනාපය පලකර ඇති නිලධාරිනියක් ඉන් ඉවත් වීමේදී 1982 ජනවාරි 01 සිට 2019 අගෝස්තු දක්වා දායක මුදල් රු. 382,884 ක් අයකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිලධාරිනියගේ විශ්‍රාම වැටුප් ගොනුව මේ වන විට සබරගමුව පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.124,649,146 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 44,599,894 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට ගිණුමට අනුව හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර්31 දිනට ගිණුමට අනුවහිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 15,732,365 | 13.544,942 | 12.390.577 | 7,873,421 | 15,609,000 | 14,904,164 | 13,115,000 | 8,671,000 |
| ii | කුලී | 34,819,400 | 30,516.529 | 29,993,888 | 5,091,631 | 32,307,000 | 28.094,330 | 25,194,000 | 5,156,000 |
| iii | බලපත්‍ර ගාස්තු | 3,850,280 | 3,299,313 | 1.386,207 | 2,094,808 | 3,400,000 | 3,620,247 | 682,000 | - |
| iv | වෙනත් ආදායම් | 65,613,000 | 47,037,127 | 81,603,701 | 47,186,789 | 52,465,000 | 46,132,288 | 40,407,975 | 95,700,453 |

**2.2.2 වරිපනම් හා බදු**

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.7,873,421 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 04 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 3,691,227 ක් ඇතුලත් වී තිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රශස්ත මට්ටම කරා ලඟා කර ගැනීමට මේ වන විට සියළු උත්සහයන් දරමින් සිටින බව දන්වමි. |

**(ආ) අක්කර බදු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.175,261 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 04 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 64,944 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු අයකර ගැනීමට සියළු උත්සහයන් දරන බව දන්වමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ කඩ කුලී ශේෂය රු. 3,541,395 ක් වූ අතර ඉන් රු. 2,837,322 ක් වසර 04 කට වඩා වැඩි කාලයක් හිඟ හිට තිබුණි. | හිඟ කුලී මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීමට සියළු උත්සහයන් දරන බව දන්වමි. |

**2.2.4** **බලපත්‍ර ගාස්තු**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව බලපත්‍ර කාලසීමාව අවසන් වී තිබුණු කර්මාන්ත 40 ක් **සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ** අතර පරිසර බලපත්‍ර ලබා ගැනිම සඳහා අයදුම් කර තිබූ ව්‍යාපාරික ආයතන 07 කට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් බලපත්‍ර නිකුත් කර නොතිබුණි. එම හේතුවෙන් සභාවට රු. 188,000 ක ආදායමක් අහිමි වී තිබූ අතර, එම ව්‍යාපාර වලින් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ කාලීන ඇගයිමක් ද සිදුව නොතිබුණි. | පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයවිය යුතුව තිබුණු රු.324,000 ක මුදලින් රු.136,000 ක් අයකර ගෙන ඇති අතර තවදුරටත් රු. 188,000 ක් අයවීමට ඇති බව දන්වමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **කාර්යසාධන වාර්තාව**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කාර්යසාධන වාර්තාව අනුව ආයතන අංශයේ දර්ශක 03 ක්, ගිණුම් අංශයේ දර්ශක 06 ක්, ආදායම් අංශයේ දර්ශක 11 ක්, සංවර්ධන අංශයේ දර්ශක 08 ක් සහ පුස්තකාල අංශයේ දර්ශක 10 ක් අපේක්ෂිත කාර්ය සාධන නිමවුම් අත්පත් කර ගැනීම සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | අපේක්ෂිත කාර්ය සාධන නිමවුම් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ක්‍රියාකාරි සැලැස්මට අනුකූල වන කාර්යසාධනය හසුරුවා ගෙන යාම සඳහා උත්සහයක් දරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව අනුව දේපල තක්සේරු කිරීම, දේපල වාර්ෂික කුලියට දීම, වත්කම් වල ආරක්ෂාව තහවුරු නොවීම, හානි හා පාඩු ලේඛනය සකස් නොකිරීම, අවිධිමත් කසල බැහැර කිරීම, කාර්ය මණ්ඩල සැකැස්ම, ශාලා විද්‍යුත් පද්ධතියක් ස්ථාපිත කිරීම, අන්තර්ජාල පහසුකම් ජනතාවට ලබාදීම යන කරුණු ඉටුකර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවේ අනුකූල නොවීම් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ දී මෙම කාර්යයන් නිසි අයුරින් හසුරුවා ගෙන යාමට කටයුතු සිදු කරන බව දන්වමි. |

**(ආ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෛනිකව කසළ ටොන් 30 ක් පමණ මිශ්‍රව එකතු කරන අතර සේවක හිඟය මත කසළ වර්ග කිරීමට නොහැකිව පැවතුණි. | සේවක හිඟයට පිළියම් යෙදිය යුතුවේ. | කැලි කසළ එකතු කිරීමේ දී දිරන හා නොදිරන කසළ ලෙසින් වර්ග කර එකතු කිරීමක් මේ වන විට සිදු කර ගෙන යනු ලබන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,672,322 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් රු.3,107,312 ක් වර්ෂ 5ක් ඉක්මවා තිබුණද ඒම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු ගිණුම් ශේෂයේ බොහොමයක් නැවත ඉල්ලන විටකදී ගෙවීම් කිරීමට ඇති මුදල් වන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු වර්ග 15 ක පුරප්පාඩු 31 ක් පැවති අතර, එක් තනතුරක් අතිරික්තව පැවතුණි. ගිනි නිවීමේ ඒකකයට අදාල තනතුරු 05 ක අනුමත සේවක සංඛ්‍යාව 20 ක් විය. ඒ තුළ අනුමත ගිනිබට සේවකයින් 12 ක් පැවතියද, අනියම් පදනමින් බඳවා ගත් 07 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. එසේම සභාවේ ක්ෂේත්‍ර පරිපාලක තනතුරද 2017 අප්‍රේල් 03 දින සිට පුරප්පාඩු වී පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 31 න් 23 ක් බඳවා ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වන අතර, ඉතිරි තනතුරු 08 සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ස්ථිර බඳවා ගැනීම් සිදු කළ යුතු බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ කැබ් රථයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කැබ් රථය සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේවන විට සිදු කරනු ලබන බව දන්වමි. |

### 3.4.2 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පරිසර අධිකාරියේ ව්‍යාපෘතියක් යටතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ දී ලබා දී තිබූ රු. 804,232 ක් වටිනා බේල් යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | උපයෝජනය කල හැකි ක්‍රමයක් හඳුනාගත යුතුය. | ප්‍රමාණවත් සේවකයින් සංඛ්‍යාවක් නොමැතිවීම පොලිතීන් පිරිසිදු තත්වයෙන් වෙන් කර තෝරා ගැනීමේ අපහසුතාවය නිසා බේල් යන්ත්‍රය ක්‍රියාත්මක නොකරන බව දන්වමි. |
| (ආ) | වර්ග අඩි 7,930 ක් පමණ විශාල වූ රංගන ශාලාවේ මූලික අවශ්‍යතාවයන් වන තිර රෙදි, ජනෙල් රෙදි, විදුලි ආලෝක පද්ධතියක්, ජෙනරේටරයක් සහ වාහන නවතා තැබීමේ පහසුකම් සලසා නොතිබීමෙන්, ඉන් අපේක්ෂිත උපයෝජනයන් සිදු වී නොතිබුණි. රංගන ශාලාවේ කුලී හා තැන්පත් මුදල් පිළිවෙලින් රු. 10,000 කින් හා රු. 5,000 කින් අඩුකිරීමට 2014 දෙසැම්බර් 30 දින මහා සභාව තීරණය කර තිබුණ ද රංගන ශාලාව සංවර්ධනය කර ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය පහසුකම් සලසා ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුවේ. | පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මහා සභාවේ අනුමතිය යටතේ ගාස්තු සංශෝධනයක් සිදු කරන ලද බවත් පහසුකම් සැපයීමට සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන්වලින් හා ප්‍රාග්ධන වැය විෂයයන්වලින් රු.25,634,280 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර අනෙකුත් පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන්වලින් සියයට පනහකට වැඩි ඉතිරිවීම් රු.18,080,708 ක් විය. | සැලසුම්සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත්, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. | අදාල කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බැවින් එම වැය ශීර්ෂ වල මුදල් සියයට සියයක්ම ඉතිරි වී පැවති බව හා වියදම් සිදු වේ යැයි සලකා ප්‍රතිපාදන වෙන්කර තැබුවද ඒවා එසේ වැය නොවූ හෙයින් මුදල් ඉතිරි වී පවතින බව දන්වමි. |

## 4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟුල වෙළඳ සංකීර්ණයේ 2001 වර්ෂයේ සිට කඩ කාමරයක් සඳහා ලැබිය යුතු එක්වන් මුදල් (Key money) රු. 50,350 ක් හා හෙම්මාතගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 ක් වෙනුවෙන් 2001 වර්ෂයේ සිට ලැබියයුතු එක්වන් මුදල් රු. 1,607,775 ක් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟුල වෙළඳ සංකීර්ණයේ පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීම මත බදුකරු කීමනි මුදලින් කොටසක් ගෙවා ඇති බවත් ඉදිකිරීම සිදු කිරීමෙන් අනතුරුව කීමනි මුදල අය කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |